# Biology

Special test paper for Biology Olympiad competition 2015

උපුටා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය

## Udayalanka Madagammana

## උදයලංකා මඩගම්මන

udayalanka madagammana

Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk
Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk
Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk
Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk Woh,xld uv.usuk
Woh,xld uv.usuk Woh,xl

අධ්‍යන පොදුසහතික පත්‍ර( උසස් පෙළ) විභාගය
2015අගෝස්තුGenaral Cetificate of Education (Adv.Leval)
Examination, August2015

නව නිර්දේශය
New Syllabus

ජීව විද්‍යාව 1
உயிரியல் 1
Biology 1

| 09 | S | 1 |
|---|---|---|

*TEST PAPER –NO-30*

*උපුටාගැනීම තහනම්*

**මෙම ප්‍රශ්ණ පත්‍රය ජීව විද්‍යා ඔලිම්පියාඩ් ප්‍රශ්ණ පත්‍ර ඇසුරින්** උදයලංකා මඩගම්මන **විසින් නිර්මාණය කර ඇති අතර මෙහි වූ කිසිම ප්‍රශ්ණයක් ශ්‍රිලංකාවේ වෙනත් මුද්‍රිත මාධ්‍යක හෝ විද්‍යුත් මාධ්‍යහෝ නිබන්ධන වලට ඇතුලත් කිරීම කතෘ මන්ඩලයේ අවසරයකින් තොරව සම්පුර්ණයෙන්ම තහනම්ය**

# Selection test for 2015 biology Olympiad competition

## මෙහි සදහන් කෙටි ප්‍රශ්ණ 38 වඩා නිවැරදි අයට ඉහත තරගාවලිය සදහා ඉතා සාර්ථකව මුහුණදිය හැකිබව අපගේ විශ්වාසයයි

(www. Edulanka .com)

01. පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වන්නේ කුමක්ද?
(1) ඇමයිලෝස්වල අඩංගුවන්නේ ග්ලූකෝස් පමණි.
(2) සෙලියුලෝස්වල අඩංගුවන්නේ ග්ලූකෝස් පමණි.
(3) ලැක්ටෝස්වල අඩංගුවන්නේ ගැලැක්ටෝස් පමණි.
(4) ප්‍රෝටීනවල අඩංගුවන්නේ $\alpha$ - ඇමයිනෝ අම්ල පමණි.
(5) සියලුම සත්‍ය ලිපිඩවල ග්ලිසරෝල් අඩංගු වේ.

02. පහත දැක්වෙන රූප සටහනේ දැක්වෙනුයේ සෛලයක විභාජන අවස්ථාවකි. එහි දැක්වෙන සෛලය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?



(1) සෛලය ද්විගුණ එකක් විය නොහැකිය.
(2) එය ඌනන විභාජනයේ අවස්ථාවක් විය හැකිය.
(3) සෛලය ශාක සෛලයක් විය නොහැකිය.
(4) සෛලයේ න්‍යෂ්ටි පටලය මුළුමනින්ම නොපෙනී ගොස්ය.
(5) වර්ණදේහ මුළුමනින්ම හිස්ටෝන ප්‍රෝටීන සමග සංඝනනය වී ඇත.

03. පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වනුයේ කුමක්ද ?
(1) ප්‍රෝටීනයක ප්‍රාථමික ව්‍යුහය සාදන්නේ රයිබොසෝමයයි.
(2) සියලුම ප්‍රෝටීන ඒවා සංශ්ලේෂණය වන අවස්ථාවි ප්‍රාථමික වයුහයෙන් පවතියි
(3) ප්‍රෝටීනයක වෙනස් ඇමයිනෝ අම්ල අතර ඇතිවන සහ සංයුජ බන්ධන එහි තෘතීයික ව්‍යුහය ඇති කිරීම සඳහා අවශ්‍ය වේ.
(4) ප්‍රෝටීන සංශ්ලේශණයේදි සමහර ඇමයිනෝ අම්ල සඳහා කේත කිහිපයක් පවතියි
(5) mRNA අනුවේ ඉන්ට්‍රෝන වල කේත ප්‍රෝටීන සංශ්ලේසණය නතර කරයි

04. පහත සඳහන් ප්‍රකාශ අතරින්වැරදි වනුයේ කුමක්ද ? ප්‍රාග්න්‍යෂ්ටිකයන් සුන්‍යෂ්ටිකයන්ගෙන් වෙනස් වනුයේ සුන්‍යෂ්ටිකයන්ගේ
(1) කශිකාවල ක්ෂුද්‍රනාලිකා නැති නිසාය.
(2) රයිබොසෝම 70 S අංශූන් වන නිසාය.
(3) වර්ණදේහවල ක්‍රොමැටින් ව්‍යුහය නැති නිසාය.
(4) නයිට්‍රජනේස් එන්සයිම නැති නිසාය
(5) සෛල බිත්තිවල පෙප්ටයිඩ සංයෝග අඩංගු නිසාය.

05. පහත සඳහන් ප්‍රකාශ අතරින්වැරදි වන්නේ කුමක්ද ?  උක් ශාකයක පත්‍රයක් හිරු එළියට නිරාවරණය වූ විට
(1) පත්‍ර මධ්‍ය සෛල තුළ PS II ප්‍රභා ප්‍රතික්‍රියා සිදුවේ.
(2) කලාප කොපු සෛල තුළ වැඩිපුර PS I හා PS II ප්‍රභා ප්‍රතික්‍රියා සිදුවේ.
(3) පත්‍ර මධ්‍ය සෛල තුළ මැලේට් නිපදවයි.
(4) කලාප කොපු සෛල පයිරුවේට් නිපදවයි.
(5) මැලේට් හා පයිරුවේට් ප්ලාස්මබන්ධ තුළින් පරිවහනය කෙරේ.

06. පහත සඳහන් ප්‍රකාශ අතරින්වැරදි වන්නේ කුමක්ද?
(1) ඇතැම් බැක්ටීරියාවල මයිටොකොන්ඩ්‍රියා නොමැති නමුත් ඒවාට ඔක්සිකාරක පොස්පොරයිලීකරණය කළ හැකිය.
(2) ඇතැම් බැක්ටීරියාවල හරිතලව නොමැති වුවත් ජලය ප්‍රභාවිච්ඡේදනය සිදුකරයි
(3) සුන්‍යෂ්ටිකයන් මෙන්ම බැක්ටීරියා ද උපස්තර මට්ටමේ පොස්පොරයිලීකරණය සිදු කරයි.
(4) ස්වායු ස්වසනය බැක්ටීරියා සෛල වල මෙන්ම දිලීර වල ද සිදුවෙයි
(5) සරව ශක්තිවාහකයා ලෙස හැදින්වෙන්නේ ATP වෙයි

07. පහත සඳහන් ප්‍රකාශ අතරින්වැරදි වන්නේ කුමක්ද?
(1) ආර්ද්‍රතාව වැඩි රාත්‍රියන් හිදී අකාෂ්ඨීය ශාකවල ශෛලම තුළ ජල විභවය ඉහළ යයි.
(2) ජල ඌන තත්වයන්හිදී ශාකවල පත්‍ර සෛල තුළ ඇබ්සිසික් අම්ලය සංශ්ලේෂණය වේ.
(3) අන්තශ්චර්ම සෛලවල කැස්පාර් පටි ඛනිජ අයනවල නිදහස් අවශෝෂණයට අවහිරයකි.
(4) ශාක පත්‍ර ආලෝකයට නිරාවරණය වූ විට පාලක සෛල වල $K^+$ එක්රැස්වෙයි
(5) ප්ලෝයමයේ පෙනේර නල සෛල අතර සුක්රෝස් පරිවහනයට ATP අවශ්‍ය වෙයි

08. පහත සඳහන් ප්‍රකාශ අතරින්වැරදි වන්නේ කුමක්ද?
(1) තෙත් වී බීජ මත ඉන්ඩෝල් ඇසිටික් අම්ලය එක් කලොත් ඒවා ඉක්මනින් ප්‍රරෝහණය වනු ඇත.
(2) පැපොල් බීජවල ඇබ්සිසික් අම්ලය ඇති නිසා ප්‍රරෝහණය පමා වේ.
(3) අන්නාසි වගා කරුවෝ ශාකවල ඒකාකාරව පුෂ්ප ප්‍රේරණය කිරීම සඳහා කාබයිඩ් භාවිත කරති.
(4) කපන ලද මල්වලට සයිටොකයිනින් යෙදූ විට ඒවා දිගු කාලයක් පරනොවී තබා ගත හැකිවේ.
(5) ගිබෙරලික් අම්ලය යෙදුවොත් ගෝවා ශාක දිග අන්තර්පර්ව සහිතව වැඩෙනු ඇත.

09. පහත දැක්වෙන ප්‍රකාශ අතරින්වැරදි වන්නේ කුමක්ද?
(1) *Cycas* බීජයක පරම්පරා තුනකට අයත් පටක ඇත. (2) ආවෘතබීජක ශාක බීජයක කළලයෙන් ඔක්සින් නිශ්පාදනය වෙයි
(3) *Sellaginella*වල මහා බීජාණුව මව් ශාකයෙන් ගිලිහීමට පෙර ප්‍රරෝහණය අරඹන අතර එය වටා ඝන බිත්තියක් ඇත
(4) *Pogonatum*වල ප්‍රොටෝනියම ජන්මානු ශෘකය මත මුලදී අර්ධ පරපෝෂී වී පසුව පූර්ණ පරපෝෂී වෙයි
(5) ශාක ලෝකය පරිණාමයේදී ක්‍රමයෙන් ජන්මානු ශාක කුඩාවන අතර ඒවායේ ජන්මානුධානි ද නැතිවියයි

10. කහඋණ සෑදුන රෝගියෙකුගේ පිත්ත ප්‍රනාලය වෛරසයක් මගින් අවහිර වන නිසා මෙම පුද්ගලයාට පහත කුමන ආහාරය ජීරණය කරගැනීමට වැඩිපුරම අපහසු වේද
(1) පළතුරුය. (2) පාන්ය. (3) පැණි රස කෑම වර්ගය. (4) තෙල් සහිත කෑම වර්ගය. (5) ප්‍රෝටීන් ය.

11. මිනිසාගේ ශ්වසන පාලන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ
(1) හයිපොතැලමසේය. (2) රතු න්‍යෂ්ටිවලය. (3) වැරෝලි සේතුවේය. (4) අනුමස්තිෂ්කයේය (5) සුසුම්නා ශීර්ෂකයේය.

12. පහත සඳහන් කුමන එක මිනිස් දේහය සඳහා ධණ පුනර්පෝෂී යාන්ත්‍රණයක් ඇතිකිරීමට පමනක් ප්‍රධානව දායක වේ ද
(1) කැල්සිටෝනින් (2) ප්‍රොස්ටග්ලැන්ඩින් (3) ඉන්හිබින් (4) ඊස්ට්‍රජන් (5) ටෙස්ටෙස්ටරෝන්

13. තම ශක්තියෙන් වැඩිම ප්‍රමාණයක් සමස්ථිතිය සඳහා වැය කරනුයේ පහත සඳහන් සතුන් අතරින් කුමන සත්ත්වයාද?
(1) සිංහරාජ වනාන්තරයේ සිටින සර්පයෙක් (2) හෝර්ටන් තැන්නේ සිටින පක්ෂියෙක් (3) සාගරයේ සිටින මෝරෙක්
(4) වියළි මිශ්‍ර වනාන්තරයක සිටින සමනළයෙක් (5) ගං මෝයක සිටින ලොඩියෙක්

14. ස්නායු සම්ප්‍රේෂක ප්‍රතිග්‍රාහක පිහිටනුයේ
(1) රැන්වියර් ගැටවලය. (2) පශ්චඋපාගම පටලයේය. (3) පූර්වඋපාගම පටලයේය.
(4) ශ්වාන් සෛලවල පටලයේය. (5) උපාගම ආශයිකාවල පටලයේය.

15. තනුක මුත්‍ර අධික ප්‍රමාණයක් නිපදවීමට හේතුව විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) ඇල්ඩස්ටරෝන් නිපදවීම අඩුවීම ජලය වැඩිපුර පානය කිරීම (2) ADH සඳහා වෘක්කානුව ප්‍රතිචාර නොදැක්වීම
(3) මධුමේහයෙන් පෙලෙන අයෙකු වීම (4) ACTH අධිකව නිපදවීම (5) ඇල්ඩස්ටරෝන් අධිකවනිපදවීම

16. හිස් කබලේ ඇති චලනය කළ හැකි අස්ථිය
(1) ප්‍රසර කීපයක් දරයි. (2) ද්විතීයික තල්ල තැනීමට සහභාගී වේ. (3) යුග චක්‍රය තැනීමට සහභාගී වේ.
(4) පාර්ශ්ව කපාල අස්ථිය සමග සන්ධානය වෙයි (5) කෝටරක දරයි.

17. මිනිස් හිස් කබලේ පහත සඳහන් අස්ථි අතුරෙන් කටහඬ අනුනාද කිරීම සඳහා අඩුවෙන්ම දායක වනුයේ කුමන අස්ථිය ද?
(1) ලලාටාස්ථිය (2) පාර්ශ්වකපාල අස්ථිය (3) කීලාස්ථිය (4) ශිද්‍රාස්ථිය (5) ඌර්ධ්වහනු අස්ථිය

18) සෙන්ටිමීටර 25-35 cm දිග ය. භ්‍රෑණයක ලක්ෂණයක් වන්නේ
(1) සාමාන්‍යයෙන් 550 - 1000 g බර ය. (2) ඇසිපිය වෙන්ව නැත. (3) හම රැලි ගැසී පවතියි.
(4) හිසකෙස් වැඩී නැත (5) දේහයේ තිබූ සියුම් රෝම ආවරණය ඉවත්වී ඇත

19. ස්ත්‍රියකගේ FSH සහ LH නිෂ්පාදනයේ උපරිමයන් දක්නට ලැබෙනුයේ
(1) ඔසප් අවධියේ ආරම්භයේදීය. (2) ප්‍රගුණන අවධියේ ආරම්භයේදීය.
(3) ස්‍රෑනිකා අවධියේ අවසාන කාලයේදීය. (4) සාවී අවධියේ ආරම්භයේදීය.
(5) ලූටීය අවධියේ අවසාන කාලයේදීය.

20. මිනිසාගේ ශුක්‍ර තරලය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද ?
(1) සාමාන්‍යයෙන් වරකට මිලිලීටර 5 සිට 8 ක් පමණ විසර්ජනය කෙරේ. (2) එහි pH අගය සාමාන්‍ය ජලයේ අගයට බොහෝ දුරට සමානය.
(3) එහි අපිවෘෂණියේ ස්‍රාවයන් ද අඩංගුය. (4) එහි විටමින් වර්ග ඇත
(5) ශුක්‍ර ආශයිකා තරලය ශුක්‍රානුසඳහා ශක්ති ප්‍රභවයකි

udayalankamadagammana

21. පහත සඳහන් සත්ව කාණ්ඩ අතුරෙන් ප්‍රථමයෙන් ගොඩබිමට පැමිනි සත්ව බාන්ධය වන්නේ
(1) ඇමොනිටාවන් (2) ට්‍රයිලොබයිටාවන් (3) ඇනලිඩාවන් (4) උභයජීවීන් (5) නෙමටෝඩාවන්

22) වැරදි ගැලපීම තෝරන්න
(1) සන්ධාන අග්‍ර ප්‍රසරය ශංඛක - අධෝහනුක සන්ධිය සාදමින් ශංඛක අස්ථිය සමඟ සන්ධානය වෙයි.
(2) තුණ්ඩාකාර ප්‍රසරය- පේශි හා බන්ධනි සම්බන්ධ වීමට පෘෂ්ඨය සපයයි.
(3) අපර කපාල සන්ධාන අග්‍ර - ඇට්ලස් කශේරුව සමග ලිස්සන සන්ධියක් සාදයි
(4) චූචුකාකාර ප්‍රසරය - කනට පිටුපසින් ඇති පේශි නිවේෂණය සඳහා
(5) කීලාභ ප්‍රසරය - පේශි නිවේෂණයට (පේශි සවිවීමට) වැදගත් ය

23. පහත සඳහන් සතුන් අතුරෙන් වාහිණිමත් ස්වසන පෘෂ්ඨයක් නොදරන්නේ කුමන සත්වයාට ද
(1) තණ පෙත්තා (2) ඉස්සා (3) ගැඩවිලා (4) මකුළුවා (5) දැල්ලා

24. සාමාන්‍යයෙන් කිට අවධියක් තිබියහැකි වර්ගයක් වන්නේ
(1) ඇරක්නිඩා (2) රෙප්ටිලියා (3) කොන්ඩ්‍රික්තියේස් (4) මැමේලියා (5) ඔස්ටෙක්තියේස්

25. සෑම ඇනලිඩාවෙකුගේම දැකිය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) දැඩි කෙඳි (2) ජලක්ලෝම (3) අංශ පාදිකා (4) මෙවුල (5) ද්‍රවස්ථිති සැකිල්ල

26. භෞමික ගොළුබෙල්ලෙකුට, මට්ටියෙකුට සහ බූවල්ලෙකුට පොදු නොවනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) ශීර්ෂණය (2) ප්‍රාවරණය (3) වෘක්කිකා
(4) ස්නායු රජ්ජු යුගල දෙක (5) බාහිර හෝ අභ්‍යන්තර කවචය

27) පහත සඳහන් ඒවායෙන් වැරදි ගැලපීම වන්නේ
(1) හේකල් - ප්‍රවේණික තොරතුරු න්‍යෂ්ටියෙන් ගෙනයන බව (2) හර්ට්විග් - සංසේචනයේදී න්‍යෂ්ටි එකතුවන බව
(3) ෆ්ලෙමින් - අනුනනය සිදුවන බව පැහැදිලි කිරීම (4) වයිස්මාන් - එකම ජීවියෙකුගේ සෛලවල ඇති වර්ණදේහ ගනන සමානබව
(5) සටින් හා බෝවේරි - වර්ණදේහ වාදය ඉදිරිපත්කිරීම

28) AABBCC හා aabbcc ප්‍රවේණී දර්ශ සහිත දෙදෙනෙක් මුහුම්කල විට $f_2$ පරම්පරාවේ ලැබෙන රූපානු දර්ශ අනුපාතය වන්නේ
(1) 9:3:3:1 (2) 9:9:9:3:3:31:1:1 (3) 64:27:18:9:3:3:1:1 (4) 27:9:9:3:9:3:3:1 (5) 64:27:9:9:3:3:1:1

29) මිනිසාගේ Y වර්ණදේහයේ ප්‍රතිබද්ධ ලක්ෂණයක් නොවන්නේ
(1) මාපට ඇඟිල්ල බද්ධ වීම (2) සමේ තද මෙලනින් ලප ඇතිවීම (3) උඩු හනුවේ පාර්ශ්වික දත් ඇති නොවීම
(4) බාහිර කනෙහි රෝම පිහිටීම (5) කම්මුල් ඇතුලට නෙරායාම

30) සෛලීය සැකිල්ලේ කාර්යයක් නොවන්නේ
(1) සත්ත්ව සෛලවල හැඩය පවත්වා ගැනීම (2) ශුක්‍රාණු සෛලවල චලනය (3) සුදු රුධිර සෛලවල පාරනයනය සඳහා
(4) මුල අග්‍රස්ථ සෛල වල වර්ණදේහ චලනය (5) ඇමීබාගේ භක්ෂ සෛලකතාව

31) අසත්‍ය ප්‍රකාශය තෝරන්න
(1) පෘතුවිය මත ජීවය වසර බිලියන 3.5 කට පෙර ඇතිවිය
(2) තත්පරයට පුද්ගලයන් තිදෙනෙකු ලෝකයට අලුතින් එක් වෙයි.
(3) ඌන සංවර්ධිත රටවල වසරකට මිලියන 30 කට අධික ජනගහනයක් මැලේරියාවෙන් මරණයට පත්වේ.
(4) වත්මන් ලෝක ජනගහනය බිලියන 6 කට අධික වේ.
(5) ලෝකයේ ජන ගහනය දෙගුන විමට අවුරුදු 40 කට අඩු කාලයක් ගතවෙයි

32) මලක පහත සඳහන් පශ්චාත් සංසේචන විපර්යාස අතරින් **සාවද්‍ය** ගැලපීම තෝරාන්න
(1) කුක්ෂිය භ්‍රෑණපෝෂය (2) ඩිම්බය බීජය (3) ඩිම්බාවරණ බීජාවරණ (4) ඩිම්බ කෝෂය ඵලය (5). ඩිම්බකෝෂ බිත්තිය ඵලාවරණය

33) පහත දැක්වෙන සංකලන අතුරින් වැරදි ලෙස දක්වා ඇත්තේ,
(1) Rhizobium ඒකසෛලික ජීවියා විෂමපෝෂී බැක්ටීරියාවකි (2) පියොෆයිටා වල සංචිත ආහාර ලෙස මැනිටොල් ඇත
(3) ඩයටම යනු පියවි ඇසට නොපෙනෙන විචිත්‍රවත් ජීවීන් ය (4) Sargassam හා ඩයටමවල කැරොටින් හා ෆියුකොසැන්තින් ඇත.
(5) රොඩොෆයිටා වල පියුකොසැන්තින් ඇතත් කසිකා නැත

34) ලිග්නිභවනය වූ සෛල ඇත්තේ
(1) ස්ථුලකෝණාස්ථරයේ සහ වල්කයේය. (2) දෘඪස්ථරයේ හා ශෛලම් වාහිනීවලය. (3) වල්කයේ හා ශෛලම් වාහිනීවලය.
(4) ස්ථුලකෝණාස්ථරයේ හා ශෛලම් වාහිනීවලය. (5) වල්කයේ හා දෘඪස්ථරයේය.

35) වසා පද්ධතිය ගැන ඇති ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය වන්නේ,
(1) මෙය පයෝලස නාලිකා, වසා කේශනාලිකා හා වසාගැටිතිවලින් සමන්විතය
(2) මාංශපේශි චලන නිසා වේගයෙන් වසා තරලය ගමන් කරයි.
(3) මිනිසාගේ විශාලම වසා ප්‍රනාලය උරස් වසා ප්‍රනාලයයි
(4) වසා ප්‍රනාල රුධිර සංසරණයට එකතුන්නේ ගෙලේ පාදස්ථ ප්‍රදේහය ආසන්නයේදීය
(5) වසා පද්ධතිය ප්‍රතිදේහ විපදවීම මෙන්ම භක්ෂක සෛලීයතාවය සඳහා ද වැදගත් ය

36) පුටිකා වැසී යන්නේ,
(1) K+ හා ජලය පාලක සෛලවලින් පිටවන විටදීය. (2) K+ හා ජලය පාලක සෛල තුළට ඇතුල්වන විටය.
(3) K+ පාලක සෛලවලින් පිටතටත් ජලය ඒ තුළටත් ඇතුල් වන විටය. (4) K+ පාලක සෛල තුළටත් ජලය පිටතටත් ගමන් කරන විටය.
(5) පාලක සෛලවල K+, ජලය හා පිෂ්ට කණිකා ප්‍රමාණය වැඩිවූ විටය.

udayalanka madagammana

37) ශ්වසන පෘෂ්ඨවල අනිවාර්ය අංගයක් නොවන්නේ,

(1) වායුන්ට පාරගම්‍ය වීම (2) ශ්වසන වායු භුවමාරුව සරල විසරණයෙන් සිදුවීම

(3) වාහිනීවත් වීම (4) තුනී වීම (5) අවශ්‍යතාවයට සරිලන හොඳ පෘෂ්ඨීක වර්ගඵලය

38) සැලමන්දරා සහ හුනෙක් නිරීක්ෂණය කළ විට යම් සමානකම් ලැබුණි. එම ලැයිස්තුව තුළ අන්තර්ගත නොවනුයේ?

(1) නිමිලන පටල දැරීම (2) කුටීර තුනක හෘදය (3) බහිස්‍රාවය වෘක්ක මගින් සිදුවීම

(4) බාහිර ශ්‍රවණ නාල රහිත වීම (5) යුගලනය වූ පංචාංගලික ගාත්‍රා

39) සංචරණ ආකාර පිළිබඳ සාවද්‍ය වන්නේ?

(1) කශිකා චලනයේදී පාදයේ සිට අග්‍රය දක්වා රිද්මික චලන ඇතිවේ.

(2) ව්‍යාජ පාද යන අන්තඃප්ලාස්මය ගලායන විට ඇතිවන තාවකාලික බහිශ්ප්ලාස්ම නෙරුම්ය

(3) පක්ෂම චලනය වන විට ඒවා ඍජුභාවයක් පවත්වා ගනියි.

(4) සෑම පක්ෂමයකට $180^0$ කට ආසන්න චාපයක චලනය වේ.

(5) කශිකා චලනය වන දිශාවට විරුද්ධ දිශාවට ජීවියා චලනය වේ.

40) ඉන්සෙක්ටා සහ කිලෝපෝඩාවන් අතර අසමාන ලක්ෂණයක් වන්නේ,

(1) බාහිර බණ්ඩනය පැහැදිලිය. (2) ශ්වාසනාල සහිතයි.

(3) ජීවන චක්‍රයේ කිසිම අවස්ථාවක පක්ෂ්ම දැකිය නොහැක. (4) ස්පර්ශක යුගල් එකකි

(5) අලිංගික ප්‍රජනනය කෞමාරෝද්භවයෙනි

**41 සිට 50 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුරු පහත වගුවෙන් තෝරාගන්න**

| | | | | |
|---|---|---|---|---|
| A, B, D | A, C ,D | A,B | C,D | වෙනත් |
| 1 | 2 | 3 | 4 | 5 |

41) බැක්ටීරියා සෛලයක පරිවෘත්තීය ක්‍රියාවලි, ඒවායේ නිපදවෙන ඵල සහ සිදුවන ස්ථාන දැක්වෙන වගුවක් මෙහි දැක්වේ.

ක්‍රියාවලිය ඵල ස්ථානය

1. ග්ලයිකොලිසිය a. NADH i. සෛල ප්ලාස්මය

2. ක්‍රෙබ්ස් චක්‍රය b. ATP ii. සෛල ප්ලාස්මය

3. ඉලෙක්ට්‍රෝන වාහක පද්ධතිය c. NADH iii. සෛල ප්ලාස්මය

4. ආලෝක ප්‍රතික්‍රියාව d. $O_2$ iv ප්‍රභාසංශ්ලේෂී පටල

5. ප්‍රෝටීන සංශ්ලේෂණය e.නයිට්‍රජනේස් V 80S රයිබසෝම

නිවැරදි සංකලන තෝරන්න

A 1 a ii B. 2 b ii C. 3 c iii D. 4 d iv E. 5 b v

42. චල ප්‍රජනක සෛල ඇත්තේ

A. බණ්ඩක්කාවල B. Aspergillus වල C. Cycas වල D. Allomymes වල E. බැක්ටීරියාවල

43. අධිරෝපණය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ කුමක්ද?

A. මෝරුලාව ගර්භාෂය වෙත පරිවහනය වීමට සංසේචනයෙන් පසු දින 3 - 4 ගතවේ.

B. සංසේචනයෙන් පසු දින 5-7 අතර කාලයේ බ්ලාස්ටකෝෂ්ඨය නිර්මානය වේ.

C. අධිරෝපණය සඳහා දින 14 ක කාලයක් ගත වේ.

D. මොරුලාව එන්ඩ්‍රොමෙට්‍රියමේ ක්‍රමයෙන් ගිලියාම මගින් අධිරෝපනය ආරම්බ වේ

E. අධිරෝපනයෙන් පසු මුලින්ම ඇතිවන කළළ පටලය වන්නේ කෝරියමයි

44. පශ්චාත් ළමා පෝෂණය පිළිබඳ වැදගත් කරුණ අතරින් නිවැරදි වන්නේ?

A. ඉපදී මාස 4-6 යන තුරු මව් කිරෙන් පමණක් පෝෂණය කළ යුතුය.

B. මාස 6 දී අර්ධ ඝන ආහාර ලබාදීම ආරම්භ කරයි.

C. මාස 8 දී පමණ එළවලු ලබාදීම නිර්දේශ නොනෙරේ

D. දරුවාට වසර 2 ක් ගත වන විට සාමාන්‍ය ආහාර ගැනීමට හුරු කළ යුතුය.

E. දරුවාට අවුරුදු 1 න් පසු මවුකිරිදීම නිෂ්ඵල ක්‍රියාවකි

45. උසස් ශාක වල දක්නට ලැබෙන වර්ධක ප්‍රජනන ආකාර හා ඒවාට උදාහරණ නිවැරදි ලෙස යුගලනය වී නැත්තේ,

A ස්කන්ධ ආකන්ධ – Canna B බල්බ – Crinum C ධාවක - *Pistia*

D බල්බිල - *Dioscoria* E අතුකැබලි *Camelia*

46. ශාක පටක රෝපණයේ භාවිතාවක් නොවන්නේ,

A ඒකගුණ ශාක ලබාග B අධිශීත තත්ත්ව යටතේ ජනක ප්ලාස්ම සංරක්ෂණය

C වැඩිවශයෙන් බහුගුනක ශාක ලබා ගැනීම D ක්ශේෂ ජාන බැංකු ඇති කිරීම

E ජාන ප්‍රතිසංයෝජිත ශාක නිපදවා ගැනීම

47 DNA ප්‍රතිවලිතය පිළිබඳ වැරදි වන්නේ

(A) ප්‍රතිවලිතය දහා ATP වැඩිවශයෙන් භාවිතා වෙයි (B) ප්‍රතිවලිතයේදී H බන්ධන කැඩීමට පෙර ද්විත්ව හෙලික්සය දිගහැරෙයි

(C) මවුදාම දෙක ඉදිරියෙන් දුහිතෘ දාම සෑදීම අඛන්ඩව සිදුවෙයි (D) ප්‍රතිවලිතයේදී DNA ලිගේස් වල කාර්යයක් නැත

(E) ප්‍රතිවලිතය අර්ධ සංරක්ෂිතව සිදුවෙයි



udayalanka madagammana

48) Depo Provera එන්නත නිසා සිදු වන්නේ
(A) එන්ඩොමෙට්‍රියම තුනී වීම නිසා අධිරෝපණය වැළකීම
(B) ගැබ්ගෙල ශ්ලේෂ්මලයේ ඝනකම අධික වීම නිසා ශුක්‍රාණු ඇතුළු වීම වැළකීම
(C) ආර්ථවය තාවකාලිකව නතර වීම
(D) ඩිම්බ මෝචනය වැළකීම
(E) එන්ඩෝමෙට්‍රියමේ ප්‍රගුනනය නතර වීම

49) පේෂී පටකය පිළිබඳ වැරදි වන්නේ
(A) හෘත් පේෂී පේෂීජන්‍ය නිසා ස්නායු වලට ප්‍රතිචාර නොදක්වයි
(B) සිනිඳු පේෂී සියල්ල අනිවාර්යෙන් රිද්මයානුකූලව සංකෝචනය වෙයි
(C) සිනිඳු පේෂී හා කංකාල පේෂී විඩාවට පත්වෙයි
(D) හෘත් පේෂී විඩාවට පත් නොවෙයි
(E) හෘත් පේෂී සෛල ඒක න්‍යෂ්ටික වෙයි

*50) නිවැරදි ප්‍රකශ/ ප්‍රකාශය තෝරන්න*
(A) *Salmonella typhi සෛල පටලයේ අඩංගු ලිපෝපොලිසැකරයිඩ බහිෂ්ධූලක වේ*
(B) *එන්ටරොටොක්සින - ආමාශ ආන්ත්‍රික මාර්ගයේ සෛල වලට පහර දී ඒවා මරයි*
(C) *බොහෝ අසාමාන්‍ය තත්ත්වවලදී වමනය සහ පාචනය මගින් අහිතකර බැක්ටීරියා ආහාර මාර්ගයෙන් නෙරපනු ලබයි.*
(D) *ලැක්ටික් අම්ලය ( L actic acid) බොහෝ ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන්ට අහිතකරවූ පරිසරයක් නිර්මාණය කරයි.*
(E) ප්‍රදාහත ප්‍රතිචාරයේදී *ආසාදිත ස්ථානයෙන් රුධිරය වහනය වීමක් සිදුවෙයි*

මෙම ප්‍රශ්ණ පත්‍රය සඳහා පිළිතුරු ලබා ගැනීම සඳහා 071-4459115 යන මාගේ දුරකථන අංකය හෝ madagammanau@yahoo.com වෙත පණිවිඩයක් එවා ලබාගන්න

ප්‍රවීන ජීවවිද්‍යා දේශක හා විද්‍යාඥ

# උදයලංකා මඩගම්මන

udayalanka madagammana